# සංස්කෘතික පූර්ණය

(සාහිත්‍ය උත්සව කලාපය)

1992 ජූලි – සැප්තැම්බර්

■ 1. වෙළුම
3. කලාපය

■ සංස්කරණය
මහාචාර්ය එච්. ටී. බස්නායක
සංස්කරණ සහාය
මාපා තිලකරත්න

■ මධ්‍යම සංස්කෘතික අරමුදල
212/1, බෞද්ධාලෝක මාවත
කොළඹ 07.

## ස්තූප පේසාවේ සංකේතාර්ථ

කථිකාචාර්ය අනුර මනතුංග

ස්තූපයේ නිර්මාණාංග අතර, එහි ගර්භය පාමුලින් ස්තූපය වටා දිවෙන වටකුරු වේදිකාව හෝ වේදිකා කීපය කැපී පෙනෙන අංගයක් වේ. මෙය තත් ව්‍යවහාරයේ පේසාව, පේසාවළලු, තුන් මහල් පේසාව යන නම්වලින් හඳුන්වනු ලැබේ. මෙකී නිර්මාණාංගයේ උපයෝගීතාවය, එහි සංකේතාර්ථය සහ ඒ සඳහා යෙදෙන ඉහත කී නම්වල නිරුක්තිය පිළිබඳ මේ ලිපියෙන් සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලංකාවේ ස්තූපය පිළිබඳව පරණවිතාන සූරීන් විසින් ලියන ලද අනගි නිබන්ධයේ ස්තූප පේසාවන් පිළිබඳවද සැළකිය යුතු විස්තරයක් අඩංගු වේ. 1 ස්තූපය වන්දනාමාන කිරීමට පැමිණෙන බැතිමතුන්ට මල් තැම්පත් කිරීම සඳහා වේදිකාවක් ලෙස පේසාවන් නිර්මාණය කරන්නට ඇති බව ඔහු එහි යෝජනා කරයි. පේසාවන් සඳහාපාලි සාහිත්‍යයේ යෙදෙන පුප්ඵාධාන යන වචනයේ 'මල් තැන්පත් කිරීමේ ස්ථානය' වැනි අර්ථයක් ගැබ් වී තිබීම මීට ප්‍රබල සාධකයක් වූ බව පෙනේ. ගෛගර් පඬිතුමා විසින් මහාවංශ පරිවර්තනයේදී 2 ද, රීස් ඩේවිස් පඬිතුමා විසින් සිය පාළි ශබ්දකෝෂයේ 3 ද මේ වචනය සඳහා ඒ සමාන අර්ථයක් දී තිබීම පරණවිතාන සූරීන්ට රුකුලක් වී තිබේ.

වචනාර්ථය කෙසේ වුවද, මෙවැනි කාර්‍යයක් සඳහා පේසාවන් භාවිතා කිරීමේදී පැන නැගිය හැකි ප්‍රායෝගික දුෂ්කරතාවයන් පිළිබඳව ද පරණවිතානයන්ගේ අවධානය යොමු වූ බව පෙනේ. ශ්‍රී ලංකාවේ විශාල ස්තූපවල උස් පේසාවන් මත මල් තැන්පත් කිරීම අසීරු බව මෙන්ම ඉහළ පේසාවන් මත මල් තැන්පත් කිරීමට නම් පහත පේසාවන් මත පා තැබීමට සිදුවන බවද ඔහු පෙන්වා දෙයි. මේ නිසා එවැනි ස්තූපවල පේසාවන් එකී කාර්යය සඳහා භාවිතා නොවන්නට ඇති බව කියන පරණවිතාන, එසේ වුවද ඒ සඳහා යෙදුණු මුල් නම (පුප්ඵාධාන)දිගටම ව්‍යවහාරයේ පවතින්නට ඇතැයි විශ්වාස කරයි. සාංචි ස්තූපයේ පේසාව පිළිබඳව සර් ජෝන් මාර්ෂල් ඉදිරිපත් කළ අදහසට 4 ද අනුකූලතාවය දක්වමින්, ඇතැම් විටක මේ පේසාවන් ස්තූපය පැදකුණු කිරීම සඳහා ප්‍රදක්ෂිතා පථයක් ලෙස භාවිතා වන්නට ඇතැයි පරණවිතාන සඳහන් කරයි.

පැරණි සිංහල සාහිත්‍යයේ මේ සඳහා යෙදෙන පියවසාව, පේසාව වැනි නම්වල අර්ථය 'හරි හැටි පැහැදිලි නැතැයි' කියන හෙතෙම, ඒවා සමඟ 'මල්' යන විශේෂණය යෙදී ඇති බැවින් එම නම්වලද සාමාන්‍යයෙන් 'පුෂ්ඵාධාන' යන වචනයේ අර්ථය ඇති සේ සලකයි.

ස්තූප පේසාවන් පිළිබඳව ඉදිරිපත් වී ඇති මෙකී පුරෝගාමී අදහස්වල හරය පිළිබඳව කිසිවෙකුත් ප්‍රශ්න කළ බවක් නොපෙනේ. මේ පිළිබඳව කරුණු දැක්වූ පසුකාලීන විද්වතුන් සෑම දෙනෙකුම පාහේ මේවා මල් තැන්පත් කිරීමේ ස්ථාන හෝ ප්‍රදක්ෂිනා පථ ලෙස භාවිතා වූ බව පිළිගෙන තිබේ. 5 එහෙත් ස්තූප පේසාවේ මූලික අරමුණ මීට ඉදුරා වෙනස් බව මේ ලේඛකයාගේ අධ්‍යයනයන්ගෙන් පෙන්නුම් කෙරේ.

සෑම ස්තූපයකම පාහේ පේසාවන්ට යාව වෙනම මල් ආසන ඉදි කොට තිබේ. පේසාවන්ගෙන් ඉටු වූ මූලික කාර්යය වූයේ මල් තැන්පත් කිරීමේ වේදිකාවක් ලෙස භාවිතා කිරීම නම්, මෙලෙස වෙනම මල් අසුන් ඉදි කිරීමේ අර්ථයක් ඇතැයි නොපෙනේ. එමෙන්ම පේසාවන් එම කාර්යය සඳහා යොදාගැනීමේදී පරණවිතානගේ ද අවධානයට යොමු වූ ප්‍රායෝගික දුෂ්කරතාවයන් ද පැන නගී. ප්‍රදක්ෂිතා පථයක් ලෙස පේසාවන් භාවිතා කිරීමේදී ද මෙකී දුෂ්කරතාවයන් ද පැන නගින අතර, විශාල පිරිසක් පේසාවන් මත නැග ගමන් කිරීම ස්තූපයේ පැවැත්මට ද හානි කර වේ. අනෙක් අතට, ස්තූපය පැදකුණු කරන්නෙකුට ඒ සඳහා පේසාවන් මත නොනැග, සළපතළ මළුව වටා ගමන් කිරීමෙන් එය පහසුවෙන් කළ හැකිය. ස්තූප මළුවේ මූලික අරමුණ ද ස්තූපය පැදකුණු කිරීම බව පෙනේ.

